# ජලභීතිකාව තුරන් කිරීම සඳහා වූ පශු වෛද්‍ය එකමුතුව
# VETERINARIANS FOR ERADICATION OF RABIES

No. 05, New Station Road, Sarasavi Uyana.
Tel : 077-3103523, 077-7226301


"Sri Lanka - A country Free of Rabies by 2014"


**අනුශාසක**
වෛද්‍ය චමිත් නානායක්කාර

**කැඳවුම්කරු**
වෛද්‍ය එස්.එම්. පුබුදු සමරවීර

**දිස්ත්‍රික් සම්බන්ධිකරණ නිලධාරීන්**

**කොළඹ** -
වෛද්‍ය උපුල් දයාරත්න

**ගම්පහ** -
වෛද්‍ය ඩබ්.එස්.කේ. සම්පත්

**කලුතර** -
වෛද්‍ය පී.එස්. ප්‍රේමචන්ද්‍ර

**මහනුවර** -
වෛද්‍ය ජේ.ආර්. අනුරංග බංඩාර

**මාතලේ** -
වෛද්‍ය ඩී.ජී.යූ. සාගරතිලක

**නුවරඑළිය** -
වෛද්‍ය කේ. මිලින්ද කොලල්පිටිය

**කුරුණෑගල** -
වෛද්‍ය උදය විජේවර්ධන

**පුත්තලම** -
වෛද්‍ය ධම්මික පෙරේරා

**රත්නපුර** -
වෛද්‍ය පී. රනිල් කුමාරතිස්ස

**කෑගල්ල** -
වෛද්‍ය නිශාන්ත විජේසේකර

**බදුල්ල** -
වෛද්‍ය එස්. සමීර මලලසේකර

**මොණරාගල** -
වෛද්‍ය ඩී.එම්. අනුර කුමාර

**අනුරාධපුරය** -
වෛද්‍ය කේ.එස්. කණිෂ්ක

**පොලොන්නරුව** -
වෛද්‍ය ඒ.කේ.එම්. ප්‍රනාන්දු

**ගාල්ල** -
වෛද්‍ය තුෂාර සූරසේන

**මාතර / හම්බන්තොට** -
වෛද්‍ය එම්.ටී. මාගමගේ

**අම්පාර** -
වෛද්‍ය හෙට්ටිහේවා ගමගේ

**මඩකලපුව** -
වෛද්‍ය කේ. කාර්තීපන්


2009-11-24

ගරු අමාත්‍ය
නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා,
සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යාංශය,
"සුවසිරිපාය"
කොළඹ.

**<u>ජාතික සුනඛ වන්ධ්‍යාකරණ වැඩසටහන පිළිබඳව</u>**
**<u>සාකච්ඡාවක් ලබාගැනීම සඳහා</u>**

ගරු අමාත්‍යතුමනි,

2014 දී ජලභීතිකාව මෙරටින් තුරන්කිරීම අරමුණුකොට ගෙන ඔබතුමාගේ මෙහෙයවීම යටතේ සෞඛ්‍ය හා පෝෂණ අමාත්‍යාංශය මගින් 2009 වසරතුල ක්‍රියාත්මක කළ සුනඛ වන්ධ්‍යාකරන වැඩසටහන ඉතා සාර්ථකව එහි අවසාන කාර්තුව වෙත ලඟාවෙමින් පවතී.

මේවන විට සමස්ථ දිවයිනතුල 2008 වර්ෂය තුල සුනඛයින් 100000 ක් හා 2009 ඔක්තෝබර් දක්වා සුනඛයින් 185000 ක් වශයෙන් මුලු සුනඛයින් 285000 ක් වන්ධ්‍යාකරණයට ලක්කර ඇත. සමස්ථ දිවයින තුලම ලක්ෂ 25 ක පමණ සුනඛ ගහනයක් ඇති අතර සුනඛ ගහනය ප්‍රමාණවත් ලෙස පාලනය සඳහා මින් සුනඛයින් ලක්ෂ 10 ක් වත් වන්ධ්‍යාකරණය කළ යුතු බව අපගේ අදහසයි.

මෙම වැඩසටහන නිසා කෙටිකාලීනව ලැබූ ජයග්‍රහණ ලෙස සුනඛයින් සුනඛයින් අතර හා සුනඛයින් සහ මිනිසුන් අතර සපාකෑම් අඩුවී ඇති බව පැහැදිලිව පෙනී යයි. බල්ලන් සපා කෑ පසු මිනිසුන් වෙනුවෙන් භාවිතා කරන එන්නත් (ARS / ARV) ගෙන්වීම සඳහා වාර්ෂිකව රුපියල් මිලියන 413 ක් වැයවන අතර 2010 වර්ෂය තුල ඒ සඳහා ඇස්තමේන්තුගත වියදම රුපියල් මිලියන 198 කි. රුපියල් මිලියන 214 ක මුදලක් මේ නිසා ශ්‍රී ලාංකිකයින් වන අපට ඉතිරි වී ඇත.

තවද දිවයින තුල වාර්ෂිකව වාර්තාවන ජලබීතිකා මරණ සංඛ්‍යාව ද පෙර වසරට සාපේක්ෂව අඩුවී ඇති අතර එයිනුත් කීපයක් බලලුන් සපා කෑම හා සීරීම නිසා සිදුව ඇති බව වාර්ථා පෙන්නුම් කරයි.

පශූ වෛද්‍යවරුන් ලෙස වන්ධ්‍යාකරණ වැඩසටහනට දායකවීමේදි අප සියලු පශූවෛද්‍යවරුන් භාරදුර වගකීමක් හා විශාල කැපකිරීමක් සිදු කරන අතර මේ සඳහා අපගේ දායකත්වය උපරිම ලෙස ලබාදීමත් වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදි මතුව ඇති ගැටලුකාරී තත්වයන් අවම කරගනිමින් වඩා නිරවුල්ව විනිවිදභාවයකින් යුතුව අමාත්‍යාංශය සමග හා පළාත් සෞඛ්‍ය ආයතන සමග කටයුතු කිරීම අරමුණු කොටගෙන 2009 ජාතික සුනඛ වන්ධ්‍යාකරණ වැඩසටහන ක්‍රියාත්මක කරන සියලු දිස්ත්‍රික් නියෝජනය කරන පශුවෛද්‍යවරුන් 2009-11-22 දින. කොළඹ 3 "ගුරුගෙදර" ශ්‍රවණාගාරයේදී රැස්ව සාකච්ඡා කළ අතර සියලු දිස්ත්‍රික් සම්බන්ධිකරණ පශූවෛද්‍යවරු එක්ව "ජලබීතිකාව තුරන් කිරීම සඳහා වූ පශූවෛද්‍ය එකමුතුව" නමින් සංවිධානයක් පිහිටුවා ගන්නා ලදි.

මෙහි පළමු ක්‍රියාමාර්ගය ලෙස ජලබීතිකාව තුරන් කිරීම සඳහා වූ පශූවෛද්‍ය එකමුතුව ලෙස අප සංවිධානය හා ගරු ඔබතුමා ඇතුලු අමාත්‍යාංශ නිළධාරීන් සමග සාකච්ඡාවක් ලබාදෙන ලෙස ඉල්ලා සිටිමු.

තවද අප සංවිධානය මගින් යෝජනා සම්මත කරගත් කාරණා ලෙස පහත කරුණු ඔබතුමාගේ අවධානය පිණිස ඉදිරිපත් කරමි.

**අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන යෝජනා**

1 පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ටෙන්ඩර් දැමීම පමාවීම නිසා සමහර දිස්ත්‍රික්කවල 2009 වන්ධ්‍යාකරණ වැඩසටහන ආරම්භ වූයේ ඔක්තෝබර් මස දීය. පෙබරවාරි මස වනවිටවත් දිවයින පුරාම ටෙන්ඩර් පටිපාටිය ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටිමු.

2 සුනඛ වන්ධ්‍යාකරණය වැනි වෛද්‍ය තාක්ෂණික කාරණයක් පිළිබඳව සමහර පළාත් ටෙන්ඩර්වල නිර්නායක ප්‍රමාණවත් නොවේ. මේ නිසා ටෙන්ඩර් පටිපාටිය මධ්‍යම රජයේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවෙන් පිළියෙල කරන ලෙසත් මේ සඳහා රජයේ පශුවෛද්‍ය සභාවේ හා ශ්‍රී ලංකා පශුවෛද්‍ය සංගමය (SLVA) වැනි ආයතයන්ගෙන් ප්‍රමිතීන් ලබාගන්නා ලෙස ඉල්ලා සිටිමු.

3 ගුණාත්මක තත්වයන් ආරක්ෂා කර ගනිමින් සුනඛයෙකු සැත්කමකට භාජනය කිරීම සඳහා දැනට පවතින මිලගණන් යටතේ අවම මිල ලෙස රු 800/- ක පමණ මුදලක් වැයවේ. නමුත් සමහර පළාත්වලදී ටෙන්ඩර්පත් ප්‍රධානය කිරීමේදී මිළ පමණක් සලකනු ලබන අතර මේ නිසා සැත්කම්වල ගුණාත්මක බව අඩුවී ඇති බව අපගේ හැඟීමයි. ටෙන්ඩර්පත් ප්‍රධානය කිරීමේදී අවම මිළ ලෙස රු 800/- ක මුදල ටෙන්ඩර් පටිපාටියට ඇතුලත් කරන මෙන් ඉල්ලා සිටිමු.

4 සුනඛ වන්ධ්‍යාකරණ වැඩසටහන ක්‍රියාත්මක කර වසර දෙකක් ගතවී ඇතත් අමාත්‍යාංශ නිලධාරීන් හා දිස්ත්‍රික් සම්බන්ධිකරණ පශු වෛද්‍යවරුන් අතර මෙතෙක් සාකච්ඡාවක් පවත්වා නොමැත. මේනිසා සමහර ගැටලුකාරී තත්වයන් වර්ධනයවී ඇත. මාස 03 කට වරක් හෝ ව්‍යාපෘතියේ ගැටලු හා ඉදිරි ප්‍රගතිය සම්බන්ධව අමාත්‍යාංශ පශුවෛද්‍ය එකමුතුව සමග සාකච්ඡාවක් ලබාදෙන මෙන් ඉල්ලා සිටිමු. තවද අමාත්‍යාංශය තුල ජලභීතිකා රෝග මර්ධන කමිටුවක් පිහිටුවන ලෙසත් (Rabies Steering Committee) ඒ සඳහා පශු වෛද්‍ය එකමුතුවට නියෝජනයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටිමු.

5 සුනඛ වන්ධ්‍යාකරණ වැඩසටහනේ පවතින අඩුපාඩු හා ගැටලුකාරී තත්වයන්, ප්‍රගති සමාලෝචන සඳහා සියලුම දිස්ත්‍රික්ක හෝ පළාත් ආවරණය වන පරිදි ජලභීතිකා රෝග මර්ධන කළමණාකරණ කමිටුවක් (Rabies Management Committee) පිහිටුවීම සඳහා සෞඛ්‍ය පළාත් නිලධාරීන් දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිමු.

මෙහි සංයුතිය
පළාත් අධ්‍යක්ෂක (සෞඛ්‍ය)
පළාත් අධ්‍යක්ෂ (පශුසම්පත්)
වසංගත රෝග මර්ධන වෛද්‍ය නිළධාරීන් (R.E.)
දිස්ත්‍රික් පශුවෛද්‍යවරුන්
සුනඛ වන්ධ්‍යාකරණ පශුවෛද්‍යවරුන්
සුනඛ සුභසාධන රාජ්‍ය නොවන සංවිධාන
උදා : මධ්‍යම පළාත

6 ජාතික සුනඛ වන්ධ්‍යාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දිස්ත්‍රික් කිහිපයක පශුවෛද්‍ය කණ්ඩායම් කිපයක් සම්බන්ධවන නිසා සැත්කම් වල ගුණාත්මක තත්වය අධික්ෂණය සඳහා ජ්‍යේෂ්ඨ පශු වෛද්‍යවරුන්ගෙන් සමන්විත කමිටුවක් පත්කරන ලෙස රජයේ පශු වෛද්‍ය සභාවෙන් හා ශ්‍රී ලංකා පශු වෛද්‍ය සංගමයෙන් (SLVA) පශුවෛද්‍ය එකමුතුව ලෙස අප ඉල්ලා ඇත. තවද සැත්කම් සඳහා ටෙන්ඩර් පත් සකස් කිරීමේදී ටෙන්ඩර් පටිපාටිය, සැත්කම් නිර්නායක හා සැත්කම් ප්‍රමිතීන් පිළිබඳව මධ්‍යම සෞඛ්‍ය අමාත්‍යාංශය හා පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය දැනුවත් කරන ලෙස අප පශු වෛද්‍ය එකමුතුව ලෙස පශුවෛද්‍ය සභාවෙන් හා ශ්‍රී ලංකා පශු වෛද්‍ය සංගමයෙන් (SLVA) ඉල්ලා ඇත.

7 දැනට සුනඛ ධේනුවන්ට මූලිකත්වය ලබාදී කරගෙන යන වන්ධ්‍යාකරණ වැඩසටහන ඉදිරියේදී සුනඛ පිරිමි සතුන්, බලලුන් හා බැලලියන් ද වන්ධ්‍යාකරණයට ලක්කල යුතු අතර කැලෑ සතුන් මගින් ජලභීතිකාව ගෘහාශ්‍රිත සතුන්ට බෝවීමේ මාර්ගය ද අවහිර කළ යුතුව ඇත. මෙවැනි කාරණා සම්බන්ධයෙන් පර්යේෂන හා අධ්‍යයනයන් කරමින් පශු වෛද්‍ය එකමුතුව ලෙස සෞඛ්‍ය අමාත්‍යාංශයට පර්යේෂන හා නිරීක්ෂණ වාර්ථා ඉදිරිපත් කළ යුතු බවද තීරණය විය.

ඉහත යෝජනා 7 ක්‍රියාත්මක කිරීම සඳහා අප පශු වෛද්‍ය එකමුතුව ගරු ඔබතුමාගේ අවධානය අපේක්ෂා කරන අතර, මේ සියලු කාරණා සාකච්ඡා කිරීම සඳහා අමාත්‍යාංශයේ ඉහල නිලධාරීන් ඇතුලුව සාකච්ඡාවක් ඉතා ඉක්මනින් ලබාදෙන ලෙස අප ඉල්ලා සිටිමු.

2009 සුනඛ වන්ධ්‍යාකරණ වැඩසටහනේ මතුව ඇති අඩුපාඩු හා අනවබෝධ තත්වයන් මගහරවා ගනිමින් 2010 වැඩසටහන වඩා සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි බව අපගේ හැඟීම වන අතර, එමගින් 2014 වසර ජලභීතිකාව මෙරටින් තුරන්කිරීමේ වසර ලෙස නම් කිරීමේ ඔබ අමාත්‍යාංශයේ දැක්ම යථාර්ථයක් බවට පත්කිරීමට ජලභීතිකාව තුරන් කිරීම සඳහා වූ පශුවෛද්‍ය එකමුතුව ලෙස අපගේ උපරිම දායකත්වය සපයන බව මෙයින් සහතික කර සිටිමු.

මෙයට

......................................................

වෛද්‍ය පුබුදු සමරවීර (කැඳවුම්කරු)
ජලභීතිකාව තුරන් කිරීම සඳහාවූ
පශුවෛද්‍ය එකමුතුව

............................................................

වෛද්‍ය චමිත් නානායක්කාර (අනුශාසක)
ජලභීතිකාව තුරන් කිරීම සඳහාවූ
පශුවෛද්‍ය එකමුතුව